**අගලවත්ත ප්‍රාදේශීය සභාව -2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉදිකිරීම් කරන ලද කැකුළන්දල දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ පිරිවැය රු.6,889,483 ක් ලෙස ගිණුම්ගත කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.10,528,724 ක් ලෙස එනම් රු.3,639,241 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.<br><br>(ආ) බැමිනියාගොඩ පොදු ඉඩම හා මාර්ගය වෙන වෙනම ගිණුම්ගත කළයුතු වුවද, රු.23,775,000 ක් වූ මාර්ගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.<br><br>(ඇ) බැමිනියාගොඩ පර්චස් 61 ක් වූ පොදු ඉඩම රු.9,150,000 ක් ලෙස තක්සේරු කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එය ඉඩම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට මංමාවත් හා බෝක්කු හා පාලම් යටතේ ගිණුම්ගත කර තිබුණි.<br><br>(ඈ) මානානහේන පොදු මාර්ගයේ තක්සේරු වටිනාකම රු.10,632,600 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.10,530,000 ක් ලෙස රු.102,600 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.<br><br>(ඉ) භෞතික සැලසුම් මංමාවත් වැඩ සටහන් අංක 04 යටතේ සැපයුම් සඳහා ණයහිමි ලෙස රු.25,670 ක් වෙන් කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.13,087 ක් ලෙස රු.12,582 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදිකරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ වශයෙන් සටහන් කර තිබුණු රු.56,544 ක මුද්දර බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වුවත්, ඒ සඳහා ණයහිමි වෙන් කර නොතිබුණි. | | |
| (උ) ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.500,000 ක් වැය කර තාවකාලිකව ඉදි කර තිබුණු කළුපහන පෙර පාසැල් ගොඩනැගිල්ල සභාවට පැවරීමක් සිදු කර නොතිබුණද, සභාවේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඌ) 2021 දෙසැම්බර් 31 දිනට ලිපි ද්‍රව්‍ය අවසන් තොගය රු.597,453 ක් වුවද , මූල්‍ය ප්‍රකාශනවල එය රු.577,421 ක් ලෙස ගිණුම්ගත කිරිම නිසා ජංගම වත්කම් රු.20,032 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) 2015 වර්ෂයේ සිට භාවිතයට නොගෙන අපහරණ තත්ත්වයේ පැවත එන මාර්ග තලනයේ වටිනාකම තක්සේරු කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කරනු වෙනුවට රු.3,180,000 ක් වු පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඒ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 18 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී සභාවට පවරා ගෙන තක්සේරු කර සියළුම පිඹුරුපත් සැකසීම කරන බව | සභාව සතු වත්කම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) තිරසර සංවර්ධන ව්‍යාපෘති යටතේ අඩු ආදායම්ලාභින් සඳහා ආධාර බෙදාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර රු.600,000 ක ණයහිමි වෙන් කිරිමක් කර තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය නොලැබුණු බැවින් ණයහිමි යටතේ දක්වා ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.31,091,976 ක වත්කම්වල ක්ෂය වටිනාකම රු.1,361,532 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | වත්කම් ක්ෂය කිරීම් නිවැරදිව කළයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.33,267,541 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,887,800 ක් විය.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවෙ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,150,000 ක් හා මුද්දර ගාස්තු රු.10,100,000 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන සකස් කර අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බස්නාහිර පලාත් සංවර්ධන ප්‍රදාන යටතේ පිරිවැය රු.6,889,483 ක් වැයකර අදියර 06 කින් නිමකර තිබුණු කැකුළන්දල දිවා සුරැකුම් මධ්‍යස්ථානය 2020 නොවැම්බර් මස සභාව වෙත භාරදී තිබුණද , ඒ සඳහා අවශ්‍ය පාලිකාවන් හා සහායකයින් බඳවා ගැනීමේ ප්‍රමාදය මත සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | පාලිකාවන් හා සහායකයින් බඳවා ගැනීමට අයදුම්පත්‍ර කැඳවා ඇති නමුත් ප්‍රමාණවත් අයදුම්පත්‍ර ලැබී නොමැති නිසා බඳවා ගැනීම් සිදු කර නොමැති බව | බඳවා ගැනීම් සිදු කර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) තක්සේරු වටිනාකම රු.2,250,000 ක් වූ JCB යන්ත්‍රය යාන්ත්‍රික ඉංජිනේරු ලවා දෝෂයන් හඳුනාගෙන තක්සේරු වාර්තාවක් ලබාගෙන අළුත්වැඩියා කළයුතු වුවත්, 2018 නොවැම්බර් මාසයේ සිට ධාවන තත්ත්වයේ නොමැති ඉහත යන්ත්‍රය දෝෂ හඳුනාගෙන තක්සේරු වාර්තාවක් ලබාගෙන 2022 මාර්තු 11 වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | අමතර කොටස් සොයා ගැනීමට නොහැකිවීම මත ඉදිරි වැඩ කටයුතු දැනට නතර වී ඇති බව | අළුත්වැඩියා කිරිමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) 2014 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු කියුබ් 03 ක ධාරිතාවයෙන් යුතු ප්‍රොටෝන් ටිපර් රථය සභා මාර්ගවල ධාවනය කිරීමේ ගැටළු හා ස්ථිර රියදුරෙකු නොමැතිවීම නිසා 2017 වර්ෂය දක්වා භාහිර පාර්ශවයන් වෙත කුලී පදනම මත ලබා දී තිබුණි. 2017 වර්ෂයේදී නැවත සභාවට භාරදී තිබුණද, එම වර්ෂයේ සිට 2022 මාර්තු 10 වන විටත් වසර 05 ක් ගතවී ඇතත් සභාවට ආදායමක් උපයා ගැනීමට හෝ සභාවේ කාර්යයන් සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | ටිපර් රථය වෙනත් සභාවක් වෙත පවරන ලෙස සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත දැන්වීම සඳහා මුදල් කාරක සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව | වෙනත් සභාවකට භාරදිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 වර්ෂයේ සිට තාක්ෂණික දෝෂයන් නිසා භාවිතයෙන් ඉවත් කර තිබූ තක්සේරු වටිනාකම රු.2,000,000 ක් වූ ගල්රෝල අළුත්වැඩියා සඳහා එහි රියදුරු විසින් 2015 වර්ෂය අවසානයේ ඉල්ලීමක් කර තිබුණද 2022 මාර්තු 10 වන දින වන විට වසර 06 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද එහි දෝෂ හඳුනාගෙන තාක්ෂණික වාර්තාවක් ලබාගෙන අළුත්වැඩියා කර නොතිබුණි. | යන්ත්‍රය පරික්ෂා කර බලා අළුත්වැඩියා කිරිමට අවශ්‍ය සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙස දන්වා තිබුණද යන්ත්‍රය රුගෙන යාමට විශාල පිරිවැයක් දැරිය යුතු හෙයින් මුදල් කාරක සභාව අනුමැතිය ලබා දී නොමැති බව | යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතා කිරිමට කටයුතු කළ යුතුය. |